# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන බල උපදෙපාර්තමේන්තුව සඳහා පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතියක් (CMMS) සැපයීම/ සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, දත්ත එක්රැස් කිරීම, යෙදවීම, ක්‍රියාත්මක කරවීම සහ නඩත්තුව සඳහා ප්‍රසම්පාදනය

## IFB අංකය - SRS F. 7804

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන බල උප දෙපාර්තමේන්තුව සඳහා පරිගණකගත, නඩත්තු කළමනාකරණ පද්ධතියක් (CMMS) යෙදවීම, සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කරවීම සඳහා දේශීය සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසු මෙහෙයැවේ.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට 2025/01/31 දින සිට 2025/02/27 දින දක්වා වැඩකරන දිනයන් හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී පහත දැක්වෙන ලිපිනයෙන් වැඩිදුර තොරතුරු ලබාගැනීම සහ ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

**දුරකථන අංක** : **94(11)2438078 හෝ 94(11) 4600202**
**ෆැක්ස් අංකය** : **94 (11) 2432044**
**ඊ මේල්** : **srs.slr@gmail.com, tender1@railway.gov.lk**
**වෙබ් අඩවිය** : **www.railway.gov.lk**

04. ලංසුකරුවන් විසින් ඉහත සඳහන් පද්ධතියක් සැපයීම සඳහා තමන්ට ඇති හැකියාව සහ ශක්‍යතාව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි සමග ඉහත අයිතම සැපයීම පිළිබඳ පසුගිය වාර්තා ඉදිරිපත් කළ යුතුය. (පසුගිය වසර 5 ක කාලය තුළ අවම වශයෙන් ශ්‍රී ලංකාවේ ගනුදෙනුකරුවන් 5 දෙනෙක් වෙත සමාන සන්නාමය විකිණීම පිළිබඳ වාර්තා).

05. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු රුපියල් 13,950/- පමණක් ගෙවීමෙන් හා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2025.01.31 දින සිට 2025.02.27 දින ප.ව. 3.00 දක්වා අභිලාෂී ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

06. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කරන ලද රු. 600,000.00 ක වටිනාකමින් යුත් කොන්දේසි විරහිත ඇපකරයක් ආකරයේ ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

07. පූර්ව ලංසු රැස්වීමක් 2025.02.13 දින පෙ.ව. 10.00 ට දෙමටගොඩ, බේස්ලයින් පාර, අංක 575, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ධාවන බල ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේදී පැවැත්වේ

08. ලංසු 2025/02/28 දින ප.ව 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ලංසු විවෘතකරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ආරාධනා කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු පිළිනොගැනේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F. 7804**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**